# කොළඹ විශ්වවිද්‍යාලය
# ශ්‍රී ලංකාව
## පුරප්පාඩු (කොන්ත්‍රාත් පදනම මත)

කොළඹ විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති අයවළුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

❖ <u>**කාර්මික (කොන්ත්‍රාත් පදනම මත)**</u>

**සුදුසුකම්**

1. 8 වන ශ්‍රේණිය සමත්විය යුතුය.

2. පහත කාර්යයන් කිරීමේ මනා පළපුරුද්දක් තිබිය යුතුය
   - I. ක්ෂුද්‍ර මිනුම් (micrometers) හා මිනුම් කියවීම හා භාගමය මානයන් (fractional dimensions) වාර්තාගත කිරීම.
   - II. වාෂ්ප, මෝටර් හා ඩීසල් යන්ත්‍රසූත්‍ර හා පිරියත පැස්සුම් පිළිබඳ හෝ ලේත්, මිලින් හා හැඩ ගැන්වීමේ (shaping) යන්ත්‍ර වැනි වැඩබිම් යන්ත්‍රසූත්‍ර (workshop mechinery) ක්‍රියාකරවීම පිළිබද විශේෂඥ දැනුම.

     සහ
   - III. රූප සටහන් කියවීමේ හා වටහා ගැනීමේ හැකියාව

3. කාර්මිකයෙකු හෝ යන්ත්‍රසූත්‍ර ක්‍රියාකරුවකු ලෙස වසර දෙකකට නොඅඩු පළපුරුද්ද

**වයස** :අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතුයි.

**මාසික වැටුප** : මාසික වැටුප රු. 30,000/- + ජීවන වියදම් දීමනාව (රු. 7800/-) + අදාළ පරිදි රජයේ අනුමත වෙනත් දීමනා සහ සේවක අර්ථසාධක අරමුදල් (EPF) 12 % + සේවක භාරකාර අරමුදල් (ETF) 3 % ප්‍රතිලාභ.

**කාලසීමාව** : කොන්ත්‍රාත් පදනම මත වසරක (01) කාලයකි. (කාර්ය සාධනය සහ විශ්වවිද්‍යාල අවශ්‍යතාවයන්ට යටත්ව කොන්ත්‍රාත් කාලය අළුත් කළ හැකිය)

අදාල අයදුම්පත්‍රය <u>www.cmb.ac.lk වෙබ් අඩවියෙන් බාගත කල හැක.</u>

සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන, කොළඹ විශ්වවිද්‍යාලය, නො.94, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03. යන ලිපිනයට 2022.12.20 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අදාල සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා තිබිය යුතුය. සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයෙහි වම් පස ඉහල කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා සහ /හෝ අනෙකුත් ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අය තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

ලේඛකාධිකාරී,<br>
කොළඹ විශ්ව විද්‍යාලය,<br>
කොළඹ 03.<br>
2022.12.02